

# ගොවිකටයුතු පුවත් හසුන

**පළිබෝධනාශක අවම වී වගාවක් ...**

වෙළුම 43 / 2019 පළමු වන කලාපය /ISSN 1991-040X




## පොලිතින් හා ප්ලාස්ටික් සඳහා පරිසර හිතකාමී විකල්ප

කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# කෘෂිකර්ම අමාත්‍යතුමාගේ නිරීක්ෂණ චාරිකාව

කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමැති පී. හැරිසන් මැතිතුමා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලය අමතන අයුරු



කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග හා ධීවර ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යධූරයට අභිනවයෙන් පත් වූ පී.හැරිසන් මහතා ජනවාරි 16 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය.

ආයතනික පර්යේෂණවල ප්‍රගතිය විමසා බැලීම මෙහි අරමුණයි. පර්යේෂණ නිලධාරීන් ඇතුළු මාණ්ඩලික නිලධාරීන් හමු වූ අමාත්‍යතුමා කෘෂිකාර්මික පර්යේෂණ වඩා වඩාත් ගොවි ජනතාවගේ ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් සෙවීම කරා යොමු විය යුතු බව සඳහන් කර සිටියේය.





කීර්ති බී. කොටගම මහතා නව අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාර ගත් අයුරු

# කීර්ති බී. කොටගම මහතා නව අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාර ගත් අයුරු

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නව අධ්‍යක්ෂවරයා ලෙස කීර්ති බණ්ඩාර කොටගම මහතා ජනවාරි මස පළමු වැනි දින සිය තනතුරේ රාජකාරි ආරම්භ කළේය.

කෘෂි ව්‍යාපාර කළමණාකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වන කොටගම මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කෘෂි විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධියක් සහ තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන් ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ගල්ඔය වැවිලි සමාගම යන ආයතනවල සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇති ඒ මහතා ලංකා හොස්පිට්ල් සමාගම, ජාතික චිත්‍රපටි සංස්ථාව, සිලෝන් ටී මියුසියම් ඇතුළු රජයට සම්බන්ධ ආයතන ගණනාවක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කරයි.

වගකීම් සහිත ව්‍යවසායකත්වය තුළින් ව්‍යාපාර ගොඩනැගීම සඳහා වූ මහඟු ආදර්ශයක් සැපයීම වෙනුවෙන් Responsible Business Leader in South Asia නම් ජාත්‍යන්තර සම්මානයට පාත්‍රව ඇති කීර්තිකොටගම මහතා එම සම්මානය දිනූ එකම ශ්‍රී ලාංකිකයා ද වෙයි.

නව අධ්‍යක්ෂතුමා කෘෂිකර්ම අමාත්‍ය පී.හැරිසන් මහතා අතින් පත් වීමේ ලිපිය ලබා ගන්නා අයුරු ඡායාරූපයේ දැක්වේ.

වගකීම් සහිත ව්‍යවසායකත්වය තුළින් ව්‍යාපාර ගොඩනැගීම සඳහා වූ මහඟු ආදර්ශයක් සැපයීම වෙනුවෙන් Responsible Business Leader in South Asia නම් ජාත්‍යන්තර සම්මානයට පාත්‍රව ඇති කීර්ති කොටගම මහතා එම සම්මානය දිනූ එකම ශ්‍රී ලාංකිකයා ද වෙයි.



# 47 වසරක නොනිම් මෙහෙවර ඇගයේ..


**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 47වන සංවත්සර සැමරුම**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ආරම්භ කර 2019 වසරේ පෙබරවාරි 21 දිනට 47 වසරක් පිරේ.

ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමී රාජ්‍ය ආයතනයක් වන 'ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය' 1972 පෙබරවාරි 21 වැනි දින ආරම්භ කරන ලද්දකි. ආයතනය පිහිටුවීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා මෙරට කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා කළ දැවැන්ත මෙහෙවර අගයනු පිණිස 1995 පෙබරවාරි 21 වැනි දින ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 'හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය' යනුවෙන් නම් කරන ලදි.

47 වන සංවරත්සරය වෙනුවෙන් සංවිධානය කළ කාලීන දේශනයක් එදින පස්වරු 2.00ට නව සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජයීය විද්‍යාපීඨයේ මහාචාර්ය එස්.ටී හෙට්ටිගේ මහතා විසින් 'රාජ්‍ය ප්‍රතිපත්ති හා පර්යේෂණ ආයෝජන' මැයින් එම දේශනය සිදු කළේය.

සියලුම සේවක මහත්ම මහත්මීහු දේශනය සඳහා සහභාගී වූහ.



අධ්‍යක්ෂතුමා සුභසාධක වෙළෙඳසැල විවෘත කරමින්...

# සුභසාධක වෙළෙඳසැල විවෘත කෙරේ

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ට සහන මිලට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීම පිණිස සුබ සාධක වෙළඳසැලක් ආරම්භ කරන ලදී.**

ජනවාරි මස 28 වන දින නව අධ්‍යක්ෂතුමාගේ සුරතින් අලෙවි සැල විවෘත කෙරිණි. සුබ සාධක අලෙවිසැල මීට වසර කිහිපයකට පෙර ද ක්‍රියාත්මක තත්ත්වයේ පැවති පසුව අක්‍රිය වී තිබේ. සුබ සාධක සංගමයේ නිලධාරී මණ්ඩලයේ කැපවීම මත එය නැවත ආරම්භ කිරීමට හැකි වී තිබේ.





# පළිබෝධනාශක අවම වී වගාවක් වෙනුවෙන් වෙනස් ප්‍රවේශයක්

**ශ්‍රී ලංකාව තුළ දැනට පවතින පළිබෝධනාශක භාවිතය අවම කිරීම සඳහා ඇති අවකාශයන් තාක්ෂණික ක්‍රමවේද, අවදානම පිළිබඳ ගොවීන් සතු ආකල්පයන් හා අනෙකුත් සමාජ ආර්ථික සාධක ඇසුරෙන් හඳුනා ගැනීම පිළිබඳව අධ්‍යයනයක් අප ආයතනයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය විසින් ආරම්භ කර තිබේ.**

**පළිබෝධනාශක** භාවිතය අවම කෘෂිකර්මාන්තයක් පිළිබඳ කතාබහ සමාජය තුළ නිරන්තරයෙන් මතුවන්නක්. බෝග වගාවේ ඵලදායිතාවය හා ගුණාත්මකභාවයට පළිබෝධනාශක අත්‍යවශ්‍ය අංගයක් වුවත් ඒවා පමණ ඉක්මවා භාවිතා කිරීම හේතුවෙනුයි බොහෝ ගැටලු නිර්මාණය වී ඇත්තේ.

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින පළිබෝධනාශක භාවිතය අවම කිරීම සඳහා ඇති අවකාශයන් තාක්ෂණික ක්‍රමවේද, අවදානම පිළිබඳ ගොවීන් සතු ආකල්පයන් හා අනෙකුත් සමාජ ආර්ථික සාධක ඇසුරෙන් හඳුනා ගැනීම පිළිබඳව අධ්‍යයනයක් අප ආයතනයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය විසින් ආරම්භ කර තිබේ.

පර්යේෂණ නිලධාරිනි ඒ.කේ.ඒ දිසානායක මෙනෙවිය විසින් සම්බන්ධීකරණය කරනු ලබන මෙම අධ්‍යයනය වී ගොවීන් 330කගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික්ක 9ක් ආවරණය වන පරිදි දියත් කර තිබේ. අධ්‍යයනයේ සහය පර්යේෂකවරුන් ලෙස ආචාර්ය ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ, පර්යේෂණ නිලධාරිනියන් වන දිළිනි පෙරේරා, යූ.ඩී.ආර් උදාරි යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

ගොවීන්ට මෙන් ම ශ්‍රී ලංකාවේ තිරසාර කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම වෙනුවෙන් කටයුතු කරන ප්‍රතිපත්ති සම්පාදකයින්ට ද අධ්‍යයනයේ සොයා ගැනීම් එකසේ වැදගත් වනු ඇත යන්න පර්යේෂකයින්ගේ අදහසයි.



# වියළි කලාපයේ එළවළු වගාවන් ආරක්ෂිත ගෘහ තුළ



**දේශගුණික** විපර්යාසයන්ට අනුගත වීම සඳහා වියළි කලාපය තුළ ආරක්ෂිත ගෘහයන්හි එළවළු වගාව සම්බන්ධ අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ පහතරට එළවළු නිෂ්පාදනයට වැඩිම දායකත්වයක් සපයනු ලබන්නේ වියළි කලාපයයි. දේශගුණික විපර්යාසයන්ට වැඩියෙන්ම ගොදුරු වන කලාපයක් ලෙසද එම කලාපය සැලකේ. එබැවින් අහිතකර දේශගුණික තත්ත්වයන්ට මුහුණ දෙන අතරම වියළි කලාපය තුළ ප්‍රමාණවත් එළවළු නිෂ්පාදනයක් පවත්වා ගෙන යාම සඳහා සම්ප්‍රදායික එළවළු වගා ක්‍රම වෙනුවට නව වගා ක්‍රම හඳුන්වා දීම වැදගත්ය.

උඩරට එළවළු වගාව සඳහා ආරක්ෂිත ගෘහයන් භාවිතා කිරීම ප්‍රචලිතය. එම ක්‍රමය අහිතකර දේශගුණික තත්ත්වයන් යටතේ පහතරට එළවළු වගාව සඳහාද වාසිදායක ලෙස යොදාගැනීමේ හැකියාවක් පවතීද යන්න සොයා බැලීමේ අරමුණින් මෙම අධ්‍යනය සැලසුම් කර තිබේ.

වියළි කලාපයේ එළවළු වගාවට වැඩි දායකත්වයක් ඇති අනුරාධපුරය දිස්ත්‍රික්කයෙහි ආරක්ෂිත ගෘහයන් තුළ එළවළු වගාව සිදු කරන ගොවීන් 70 දෙනෙකු හා සාම්ප්‍රදායික එළවළු වගාවේ යෙදෙන ගොවීන් 50 දෙනෙකුගේ නියැදියක් අධ්‍යයනය සඳහා තෝරාගෙන ඇත.

පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි මෙන්ම මෙම අධ්‍යයනයේ සම්බන්ධීකාරක නදීෂා ඩයස් මහත්මිය සඳහන් කරනුයේ ආරක්ෂිත ගෘහයන් තුළ එළවළු වගාවට අනුගත වීමට බලපාන සාධකත් දැනට එම වගාවන්හි යෙදෙන ගොවීන් මුහුණ පාන ගැටලු හඳුනාගැනීමටත් අධ්‍යයනය තුළින් හැකිවනු ඇති බවයි. මෙහි සම පර්යේෂකයින් ලෙස ජොෂ්ඨ පර්යේෂණ නිලධාරි සිදත් බණ්ඩාර මහතා සහ පර්යේෂණ නිලධාරිනි තිලණි පද්මජානි මහත්මිය කටයුතු කරති.

## පොලිතීන් නිෂ්පාදන සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය තහනම කොයිබටද?

රජය විසින් 2017 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඩි ඝනත්ව පොලිතීන් (HDPE), ෂොපින් බෑග්, පොලිතින් ආහාර දවටන සහ පොලිස්ටයරින් පෙට්ටි භාවිතය තහනම් කරන ලදී. පොලිතීන් නිෂ්පාදකයින්ගේ මෙන්ම විවිධ පාර්ශවයන්ගේ දැඩි විරෝධතාවක් එල්ල වන පසුබිමක මෙවැනි තීරණයක් ගැනීමට රජයට සිදුවන්නේ ශ්‍රී ලංකාවේ දිනකට බැහැර කරන අහිතකර පොලිතීන් හා ප්ලාස්ටික් මට්ටම සැලකිල්ලට ගැනීමෙන් අනතුරුවයි.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුළ පොලිතීන් නිෂ්පාදන සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය සඳහා යොදා ගත හැකි පරිසර හිතකාමී පිළියම් පිළිබඳ අධ්‍යයනය කිරීම වන අතර විශේෂිත අරමුණු කිහිපයක් ද ඒ අතර වේ.

විකල්පයක් හඳුන්වා නොදී රජය විසින් ගත් තීරණය හේතුවෙන් සමාජයේ විවිධ පාර්ශවකරුවන් මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගැනීම හා ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා අනුගමනය කළ හැකි තිරසාර පිළියම් හඳුනා ගැනීම ඒ අතරින් කිහිපයකි.

බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වූ මෙම අධ්‍යයනයේ තොරතුරු එළි දැක්වීමට සහ ඒ පිළිබඳව පොලිතීන් ඇතුළු අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙහිලා වගකිව යුතු විද්වතුන්ගේ අදහස් විමසීම වෙනුවෙන් වැඩමුළුවක් ඉදිරියේ දී පැවැත්වීමට නියමිතය. මානව සම්පත් හා ආයතනික පුහුණු අංශයේ පර්යේෂණ නිලධාරි සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා පර්යේෂණය සිදු කරයි.



# ගොවියා සුරක්ෂිත කරන කඩිනම් රක්ෂණ ක්‍රමවේදයක්

**ශ්‍රී ලංකාවේ කාලගුණික හා දේශගුණික දත්ත මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදයෙහි කාර්යසාධනය තක්සේරු කිරීම පිළිබඳ අධ්‍යයනය**

කෘෂිකර්මාන්තය යනු නිරන්තරයෙන් අවදානමක් සහිත සහ අවිනිශ්චිත ආර්ථික කටයුත්තකි. ශ්‍රී ලංකාව නිරන්තරයෙන් ජලය ප්‍රේරිත ස්වභාවික ආපදාවන් වන ගංවතුර, නියඟ සහ නායයෑම් වැනි ඉතාමත් සුලභ සහ විනාශකාරී ආපදාවන්ට වර්ෂය පුරා මුහුණ දෙයි. කෘෂිකර්මාන්තයේ යෙදෙන්නන්ට මුහුණ දීමට සිදුවන එවැනි අවදානම් අවම කිරීමට හැකි උපාය මාර්ගයකි රක්ෂණාවරණ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කාලගුණික හා දේශගුණික දත්ත මත පදනම් වූ බෝග (වී සඳහා) රක්ෂණ ක්‍රමවේදය පිළිබඳ ඇගයීමට ලක්කිරීමයි. මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන වශයෙන් වී වගාව සම්බන්ධයෙන් පමණක් සලකා බැලෙන අතර ද්විතීයික දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ සණස රක්ෂණ සමාගම ඇසුරෙනි.

ගොවියාට ඉතා ඉක්මනින් වන්දි ගෙවීම සඳහා මේ වනවිට ලෝකයේ දියුණු රටවල් මෙම විද්‍යාත්මක කෘෂි රක්ෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සිටින අතර අධ්‍යයනයේ සොයා ගැනීම් ගොවීන්ට මෙන්ම ප්‍රතිපත්ති සම්පදාකයින්ට ද තීරණ ගැනීම පිණිස ඉතා වැදගත් වනු ඇතැයි යන්න පර්යේෂණයේ සම්බන්ධීකරණ නිලධාරිනි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී රෝෂිණී රඹුක්වැල්ල මහත්මියගේ අදහසයි.

ආහාර අලෙවි ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින් මෙහෙයවන අධ්‍යනයේ සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන දුමින්ද ප්‍රියදර්ශන මහතා සහ රුවිනි විදානපතිරණ මහත්මිය ද පර්යේෂණ නිලධාරිනි ජයමිණි චම්පිකා මෙනවිය ද කටයුතු කරති.

## 'සිතුමු' කාන්තා ගොවිසංවිධානවල තත්ත්වය සහ සවිබල ගැන්වීමේ අවශ්‍යතා

කාන්තාවන් මූලික කරගත් කුටුම්භවල ආර්ථික මට්ටම සහ සමාජ තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍ය, පෝෂණ, අධ්‍යාපන සහ අධ්‍යාත්මික අංශයන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් 2016 වර්ෂයේ 'සිතුමු' කාන්තා ගොවි සංවිධාන වැඩසටහන ආරම්භ කරන ලදී.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ගොවිකාන්තාවන් සවිබල ගැන්වීමේ ප්‍රතිපත්ති සම්පාදනයට දායක විය හැකි මෙවලමක් ලෙස කාන්තා ගොවි සංවිධාන වර්ගීකරණය කිරීමයි. කාන්තා ගොවි සංවිධානවල ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය, කාර්යසාධනය අතින් උපරිමයේ සිට අවමය දක්වා පිළිවෙළින් තාර්කික, ස්ථායි, සාමාන්‍ය, අස්ථායි සහ අක්‍රිය ලෙස වර්ගීකරණය කිරීම පර්යේෂණ කණ්ඩායම විසින් කර තිබේ. නිසි බල ගැන්වීමේ ප්‍රවේශයක් ලෙස 'සිතුමු' කාන්තා ගොවි සංවිධාන සංකල්පය ප්‍රතිව්‍යූහගත කිරීම, වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ දූර්වලතා මඟ හැරීම හා කාර්යක්ෂම ලෙස ප්‍රගති සමාලෝචනය කිරීම යන අංශයන් ඔස්සේ නිර්දේශ ගණනාවක් අධ්‍යයන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

පර්යේෂණ නිලධාරිනී රිෆානා බුහාරි මියගේ සම්බන්ධීකරණයෙන් සිදු කළ මෙම අධ්‍යයනයේ පර්යේෂණ කණ්ඩායම ලෙස සහ අධිපර්යේෂක රේණුකා වීරක්කොඩි මිය, පර්යේෂණ නිලධාරීන් වන තුෂාරා ධර්මවර්ධන, දිනුෂා රත්නායක සහ අමල් දිසානායක යන මහත්ම මහත්මීහු කටයුතු කළහ.



# කාලික වකුගඩු රෝගය ගැන දැනුවත් කෙරේ

රජරට හා උතුරු මැද පළාත පුරා පැතිරී ඇති කාලික වකුගඩු රෝගය සම්බන්ධයෙන් වූ දේශනයක් පෙබරවාරි මස 07වන දින සුබසිංහ ශාලාවේ දී පැවැත්විණි. වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය හා ජ්‍යොෂ්ඨ පර්යේෂක ආචාර්ය කමල් ගම්මන්පිල මහතා විසින් එම දේශනය සිදු කළේය.

අපේ රටේ උතුරු මැද, උතුරු නැඟෙනහිර හා වයඹ පළාත්වල බහුලව පැතිර ඇති වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව කඳුරට ජලයෙන් ලැබෙන කැඩ්මියම් බවට තමා වසර 5 ක් ඇතුළත කළ අධ්‍යයන හා පර්යේෂණ අනුව හෙළිවූ බව ඔහු තම දේශනයේ දී සඳහන් කළේය.

එංගලන්තයේ ඉම්පීරියල් සරසවියේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය හා ජ්‍යොෂ්ඨ පර්යේෂකයෙකු වන ඒ මහතා වැඩි දුරටත් සඳහන් කරනුයේ ඌව හා මධ්‍යම පළාත්වල ජනතාව තම වගාවන් කරන්නේ අහස් දියෙන් නිසා ඔවුන්ට වකුගඩු රෝගය වැළඳීමේ ප්‍රවණතාව අඩු බවයි. ආයතනයේ සියලුම මාණ්ඩලික නිලධාරීහු මෙම දේශනය සඳහා සහභාගී වූහ.

# ත්‍රිපිටකාභිවන්දනා සැමරුම

ථෙරවාද ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ඓතිහාසික පියවරට නව දිගුවක් එක් කරමින් ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස සංරක්ෂණය කරන ලෙසට ථෙරවාද බෞද්ධ රටවල සාමුහිකත්වයෙන් ශ්‍රී ලංකාව යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කරන යෝජනාව ප්‍රකාශයට පත් කිරීම වෙනුවෙන් රජය විසින් ත්‍රිපිටකාභිවන්දනා සතියක් ප්‍රකාශයට පත් කෙරිණි.

සියලුම රාජ්‍යආයතනවල පැවැත්වෙන වැඩසටහන්වලට සමගාමීව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කළ ධර්ම දේශනාමය පිංකම මාර්තු මස 22 වන දින ආයතන පරිශ්‍රයේ දී පැවැත්වුණි. පූජ්‍ය වැව්ල මහානාම ස්වාමීන් වහන්සේ විසින් එම විශේෂ ධර්මදේශනාව පැවැත්වූ සේක.

## ගොවි කටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබාගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකි ය.

උපදේශකත්වය

කීර්ති බී. කොටගම

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

අධීක්ෂණය

එස්.ඒ.සී.යූ. සේනානායක

ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

සම්පාදනය

වසන්ති රාජපක්ෂ

ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

නිර්මාණකරණය

උදේනි කරුණාරත්න

ගොවිකටයුතු පුවත් හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදාහැරීම -
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114, විජේරාම මාවත කොළඹ 07
දුරකථනය - 0112 696981, ෆැක්ස් - 0112 692423